Nestlé Good food, Good life

මාධ්‍ය නිවේදනය
14 සැප්තැම්බර් 2020, කොළඹදී

# ශක්තිමත් විදේශ විනිමයකට ලබාදුන් දායකත්වයට හා පොල් කර්මාන්තයේ ප්‍රවර්ධනයට ලබාදුන් ක්‍රමෝපායික සහාය වෙනුවෙන් ලෝක පොල් දිනයේදී නෙස්ලේ සමාගමට රජයෙන් සම්මානයක් පිරිනැමෙයි

ලෝක පොල් දිනයට සමගාමීව පැවති විශේෂ උත්සවයකදී, ශ්‍රී ලංකා පොල් කර්මාන්ත අධිකාරීන් වෙතින් නෙස්ලේ සමාගමට සුවිශේෂී ඇගයීම් සම්මානයක් හිමිවිය. ඒ, නෙස්ලේ ලොව විශාලතම පිටි කළ පොල් කිරි අපනයනකරුවන් අතරින් කෙනෙක් ලෙස ශක්තිමත් විදේශ විනිමයකට ලබාදුන් දායකත්වයත්, ශ්‍රී ලංකා පොල් කර්මාන්තයේ ප්‍රවර්ධනය උදෙසා රජයට ලබාදුන් ක්‍රමෝපායික සැලසුම් සහායත් අගයමිනි. එමෙන්ම නෙස්ලේ ව්‍යාපාර මෙහෙයුම් හරහා 9,000කට වැඩි දේශීය පොල් වගා පවුල් ප්‍රමාණයක් සවිබල ගැන්වී තිබේ. ගරු වැවිලි රාජ්‍ය අමාත්‍ය අරුන්දික ප්‍රනාන්දු, ගරු වැවිලි අමාත්‍ය වෛද්‍ය රමේෂ් පතිරණ හා පොල් සංවර්ධන අධිකාරිය, පොල් වගා මණ්ඩලය සහ පොල් පර්යේෂණ ආයතනය යන ආයතනවල සභාපති ජයන්ත වික්‍රමසිංහ යන මහත්වරු අතින් මෙම ඇගයීම් සම්මානය පිරිනැමුණි.

"අපගේ ව්‍යාපාර හරහා සියලු දෙනාටම ධනාත්මක බලපෑමක් හිමි වන අතර එය අඛණ්ඩව ඇගයීමට ලක්වීම අපට විශාල ආඩම්බරයක්. යහපත් ආහාර, යහපත් ජීවිතයක් (Good food, Good life) ලබාදෙන සමාගමක් ලෙස අපේ පාරිභෝගිකයන්ට පමණක් නොව අපේ ප්‍රජාවට ම නෙස්ලේ නිෂ්පාදන තුළින් යහපතක් ඇතිකිරීම අපේ බලාපොරොත්තුවයි. වර්ෂ 1984 පටන් නෙස්ලේ, තම 800කට ආසන්න සේවකයින්ගේ ද සහායෙන් ශ්‍රී ලංකාවේ වෙළෙඳපොළට සපයන තම නිෂ්පාදනවලින් 90%කට වඩා වැඩි ප්‍රමාණයක්, කුරුණෑගල පිහිටි සිය අති නවීන බහු නිෂ්පාදන කර්මාන්තශාලාවේ දේශීයව නිෂ්පාදනය කරනවා. ඊට අමතරව ශක්තිමත් අපනයන ව්‍යාපාර මෙහෙයුම් වලින් ද ශ්‍රී ලංකාවේ ආර්ථිකයට සුවිශේෂී දායකත්වයක් සැපයීමට නෙස්ලේ සමත්ව තිබෙනවා. ගෙවුණු වසර 114ක කාලය තුළ වගේම ඉදිරියටත් ශ්‍රී ලංකාව තුළ එසේ කටයුතු කිරීමට අපි කැපවී සිටිනවා," යනුවෙන් නෙස්ලේ ලංකා කළමනාකාර අධ්‍යක්ෂ ෆැබ්රිස් කැවලින් මහතා සම්මානය ලබාගනිමින් පැවසීය.

නෙස්ලේ තම මැගී පිටිකළ පොල් කිරි නිෂ්පාදනය සඳහා වසර 35කට ආසන්න කාලයක් පුරාවට ශ්‍රී ලංකාවේ පොල් යොදා ගෙන ඇත. වර්තමානය වනවිට එහි උසස් ගුණාත්මක බව හා රසය නිසා ශ්‍රී ලංකාවේ අංක එකේ පිටිකළ පොල් කිරි නිෂ්පාදනය පමණක් නොව රටවල් 50කට අධික සංඛ්‍යාවකට අපනයනය කරන ලොව විශාලතම පිටිකළ පොල් කිරි අපනයනකරුවන් අතරින් කෙනෙක් බවට පත්වී ඇත. 2019

වසරේදී දේශීය පොල් මිලදී ගැනීම සඳහා රුපියල් බිලියන 2.6ක මුදලක් නෙස්ලේ සමාගම වැය කොට තිබේ. එමගින් ගොවි පවුල් 6,000කට වැඩි ප්‍රමාණයක ජීවනෝපාය සංවර්ධනය වී ඇත.

එමෙන්ම තවත් පොල් ගොවීන් හා වගාකරුවන් 3,000කට තම ගොවිපොළවල, ගෙවතුවල හා සාම්ප්‍රදායික පොල් ත්‍රිකෝණයෙන් පිටත ප්‍රදේශවල පොල් වගාකිරීමට ආධාර ලබාදෙන (පොල් වගා මණ්ඩලය හා සහයෝගයෙන් ක්‍රියාත්මක වන) නෙස්ලේ පොල් වගා සැලසුමට ද නෙස්ලේ දායක වෙයි. නියඟය හා විවිධ රෝග ආසාදන හේතුවෙන් පොල් සැපයුම අඩාල වී ඇති බැවින් ගෘහස්ථ පරිභෝජනය සඳහා පොල් ලබාගැනීමේ හැකියාව වැඩිකිරීම එහි අරමුණ වී ඇත.

---